සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2017

## Primary Piriven Mid-Year Term Test - 2017

### 3 වසර / Grade 3

භූගෝල විද්‍යාව
**Geography**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

**(01). කෙටි පිළිතුරු සපයන්න.**

i. පෘථිවිය හඳුන්වන තවත් නමක් ලියන්න.

ii. සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහයා නම් කරන්න.

iii.ලංකාව පිහිටා ඇති අක්ෂාංශ සහ දේශාංශ නම් කරන්න.

iv.ලංකාවට ඊසාන දිග මෝසම් වැසි ලැබෙන කාලය සඳහන් කරන්න.

v. භ්‍රමණය හා පරිභ්‍රමණය හඳුන්වන්න.

vi. සමකය හඳුන්වන තවත් නමක් ලියන්න.

vii.උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක නම් කරන්න.

viii.ගංවතුර තර්ජනයට ලක්වන දිස්ත්‍රික්ක හතරක් සඳහන් කරන්න.

ix. භූගෝල විද්‍යාවේ උප විෂය හතරක් ලියන්න.

x. ජලයෙන් ලබාගන්නා ප්‍රයෝජන හතරක් ලියන්න. ( ලකුණු 4×10 =40 )

(02). i. භෞතික හා සංස්කෘතික පරිසරය හඳුන්වන්න.

ii. පරිසරය විනාශ කරන ක්‍රියාකාරකම් මොනවාද?

iii. පරිසරය ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් විස්තර කරන්න.

(ලකුණු 4+5+6 =15)

(03). i. පෘථිවියේ ඇති අක්ෂාංශ හා දේශාංශ ගණන වෙන වෙනම දක්වන්න.

ii මධ්‍ය දේශාංශය, මධ්‍ය අක්ෂාංශය හා සම්මත දින රේඛාවේ අගයන් අංශකවලින් ලියන්න.

iii. පෘථිවියේ ආදර්ශ ගෝලයක සමකය, කර්කටක නිවර්තනය, මකර නිවර්තනය ඇඳ නම් කරන්න. (ලකුණු 4+5+6 =15)

(04). i. සෞරග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහලෝක පහක් නම් කරන්න.

ii. සෞරග්‍රහ මණ්ඩලයේ කුඩාම ග්‍රහලෝකය හා උප ග්‍රහයන් වැඩිම සංඛ්‍යාවක් සිටින ග්‍රහලෝකය හා එහි සිටින උපග්‍රහයන් සංඛ්‍යාව ලියන්න.

iii. පෘථිවියේ ඇති සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 4+5+6 =15)

(05). i. භූගෝල විද්‍යා විෂය කෙටියෙන් හඳුන්වන්න.

ii පරිසරයේ භෞතික ලක්ෂණ තුනක් හා සංස්කෘතික ලක්ෂණ තුනක් නම් කරන්න.

iii. භූගෝල විද්‍යාව ඉගෙන ගැනීමේ ප්‍රයෝජන පැහැදිලි කරන්න.

(ලකුණු 4+5+6 =15)

(06). i. ලෝකයේ ඇති ප්‍රධාන සාගර නම් කරන්න.

ii ලෝකයේ ඇති මහාද්වීප 05 ක් නම් කරන්න.

iii. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය රූප සටහනකින් ඇඳ ලකුණු කොට නම් කරන්න.

(ලකුණු 4+5+6 =15)

(07). i. වායුගෝලය කෙටියෙන් හඳුන්වන්න.

ii වායු දූෂණය සඳහා දායක වන මානව ක්‍රියාකාරකම් මොනවාද?

iii. වායු ගෝලයේ ස්තර රූප සටහනක් ඇඳ ලකුණු කර නම් කරන්න.

(ලකුණු 4+5+6 =15)